# <u>දොම්පෙ ප්‍රාදේශීය සභාව</u>

**2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීම.**

පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා සැපයුම්කරුවන් සහ කර්මාන්ත වැඩ සිදු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් 2025/11/15 දින ප.ව.3.00 දක්වා සතියේ සෑම වැඩ කරන දිනකම භාර ගනු ලැබේ.

ලියාපදිංචිය ඉල්ලුම් කරන ආයතනයේ හෝ පුද්ගලයාගේ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම් පත්‍රයක් ඔබ විසින්ම සකස් කර ගත යුතු යි.මෙම සියලු අයදුම්පත් ලියාපදිංචි ගාස්තු සමග ලියාපදිංචි තැපෑලෙන් සභාපති,දොම්පෙ ප්‍රාදේශීය සභාව,කිරිදිවැල යන ලිපිනයට 2025/11/15 වන දින ප.ව.3.00 ට පෙර ලැබෙන සේ එවිය යුතු ය.සැපයුම්කරුවෙකුට ඕනෑම අයිතම ප්‍රමාණයක් සැපයීම වෙනුවෙන් ලියාපදිංචි විය හැකි අතර,එක් අයිතමයක් වෙනුවෙන් රු.2000.00(බදු රහිත)ගෙවිය යුතුය.මේ සඳහා මුදල් ඇණවුම් භාර නොගන්නා අතර සතියේ වැඩ කරන දිනක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කිරිදිවැල පිහිටි ප්‍රධාන කාර්යාලය වෙත පැමිණ මුදලින් ගෙවිය හැකිය.චෙක්පත් මගින් මුදල් ගෙවනු ලබන්නේ නම් සභාපති දොම්පෙ ප්‍රාදේශීය සභාව යන නමින් චෙක්පත් ලිවිය යුතුය.අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ “සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය 2026” යනුවෙන් සඳහන් කළ යුතුය.

## <u>උපලේඛන අංක 01</u>

<u>(අ).සැපයුම්</u>

1. කාර්යාල උපකරණ (වානේ,ප්ලාස්ටික් හා ලී බඩු උපකරණ).
2. ලිපි ද්‍රව්‍ය.
3. වීථි පහන් කට්ටල සහ සියළුම විදුලි නඩත්තු උපකරණ.
4. කසල කරත්ත,සෞඛ්‍ය උපකරණ සැපයීම.
5. ගොඩනැගිලි ද්‍රව්‍ය හා තීන්ත වර්ග.
6. වාහන අලුත් වැඩියා කිරීම,ටින් කරින්,පේන්ට් ආදිය.
7. කර්මාන්ත උපකරණ,මාර්ග උපකරණ,උදලු තල හා කම්මල් ආවුද සැපයීම.
8. නිළ ඇඳුම් රෙදි හා පාවහන්.
9. කොන්ක්‍රීට් හියුම් පයිප්ප හා සෙප්ටික් ටැන්ක්.
10. සියළු තාර වර්ග හා කෝලාස්.
11. රෝනියෝ යන්ත්‍ර,ඡායා පිටපත් යන්ත්‍ර,ගණක යන්ත්‍ර,පරිගණක යන්ත්‍ර හා උපාංග සැපයීම.
12. විෂ බීජ නාශක ද්‍රව්‍ය සැපයීම.
13. ඉලෙක්ට්‍රොනික් උපකරණ සැපයීම.
14. ටයර්,ටියුබ්,ටේපර් හා වාහන වර්ග සැපයීම.
15. ක්‍රීඩා භාණ්ඩ සැපයීම.
16. ආයුර්වේද ඖෂධ සැකසීමේ අමු ද්‍රව්‍ය

<u>(ආ). සේවා සැපයීම.</u>

1. නොතාරිස් හා නීතීඥ සේවා.
2. මිනින්දෝරු සේවා.
3. වාහන සේවා කිරීම.

4. කම්මල්කරුවන්ගේ සේවා.
5. ගලිබවුසර් / වතුර බවුසර් කුලියට සැපයීම.
6. යකඩ වැඩකරුවන්ගේ සේවා (පෑස්සුම් කටයුතු).
7. ආදාහනාගාර අළුත් වැඩියාව.
8. වායු සමීකරණ අළුත් වැඩියාව.(වාහන හා කාර්යාල)
9. ලිපි ද්‍රව්‍ය මුද්‍රණ කටයුතු.
10. කසල කරත්ත සෞඛ්‍ය උපකරණ අළුත්වැඩියාව.
11. මෝටර් වාහන අළුත් වැඩියාව හා කුෂන් වැඩ.
12. යතුරු ලියන,රෝනියෝ යන්ත්‍ර,ඡායා පිටපත් යන්ත්‍ර අළුත් වඅඩියාව හා සේවා කිරීම.
13. පරිගණක යන්ත්‍ර අලුත් වැඩියාව හා සේවා කිරීම.
14. අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම.
15. භාෂා පරිවර්තන සේවා සැපයීම.(ඉංග්‍රීසි / දෙමළ)

<u>(ඇ).කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.</u>

කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු

1. රු.2,000,000.00 දක්වා කොන්ත්‍රාත් සඳහා රු. 4000.00
2. රු.2,000,000.00 ට වැඩි කොන්ත්‍රාත් සඳහා රු. 5000.00

පොදු කොන්දේසි

1. පෙර වර්ෂයේදී අසාධුගත සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලබන අතර ඔවුන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.
2. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම සැපයුම් හා කොන්ත්‍රාත්කරුවෙකුම තමාගේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි.
3. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම කොන්ත්‍රාත්කරුවෙකුටම ගොඩනැගිලි කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ආයතනයේ ලියාපදිංචි සහතිකයේ එම පිටපතක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි.
4. භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් රජයේ අනුමත බදු කොන්දේසි වලට හා සභා නීති රීති වලට යටත් විය යුතුය.
5. සැපයුම්කරුවන් විසින් සභාව අපේක්ෂා කරන කාලයක් තුළ භාණ්ඩ සැපයිය යුතුය.
6. අවශ්‍ය වූ විටෙක ලියාපදිංචි ලයිස්තුවෙන් පිටත භාණ්ඩ හා සේවා ලබා ගැනීම දොම්පෙ ප්‍රාදේශීය සභාව සතුය.
7. අයිතම 01 ට වඩා අයදුම් කරන්නේ නම් ඒ එක් එක් අයිතමය සඳහා වෙන වෙනම අයදුම් කර අදාළ ලියාපදිංචි මුදල ගෙවීම අවශ්‍ය වේ.
8. වැඩි දුරටත් විස්තර අපගේ පොදු දුරකථන අංක 033-2269260 අංකය ඇමතීමෙන් ලබාගත හැකිය.

2025 /09 / 17

සභාපති
දොම්පෙ ප්‍රාදේශීය සභාව

<u>දොම්පෙ ප්‍රාදේශීය සභාව</u>

<u>2026 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.</u>

<u>අයදුම් පත්‍රය.</u>

1. ව්‍යාපාරයේ නම : ........................................................................................................................................

2. ව්‍යාපාර ස්ථානයේ ලිපිනය : ........................................................................................................................

3. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ අංකය හා දිනය : .........................................................................................

   (ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණන්න)

4. වැට් අංකය : ..........................................................................................................................................

5. සම්බන්ධ කළ හැකි පුද්ගලයින්ගේ නම් : ...................................................................................................

   ............................................................................................................................................................

6. දුරකතන අංකය : ස්ථාවර : ........................................ ජංගම : ..............................................................

7. ෆැක්ස් අංකය : ........................................................................................................................................

8. විද්‍යුත් තැපැල් ලිපිනය ; ...........................................................................................................................

9. ව්‍යාපාරයේ ස්භාවය : ..............................................................................................................................

10. මෙම ආයතනයට ණය පහසුකම් සැපයීමේ කොන්දේසි :

    ..............................................................................................................................................................

    ..............................................................................................................................................................

    ............

11. සැපයීමට අපේක්ෂා කරන ද්‍රව්‍ය :

    ............................................................................................................................................................

12. වෙනත් කරුණු -

    ..........................................................................................................................

    ........................................................................................................................................

    ........................................................................................................................................

    ........................................................................................................................................

    ........................................................................................................................................

දිනය : .......................................  .............................................................

අත්සන (අයිතිකරු)

නිල මුද්‍රාව ;